ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1979 අංක 24 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 අප්‍රේල් 27, වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 45 යි

තැපැල් ගාස්තුව; ශත 25 යි

# 1979 අංක 24 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 54/78.

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1979 අංක 24 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 15 දරන අපරාධ නඩු විධාන (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) (අ) ඒ වගන්තියේ (අ) ඡේදයෙහි "සිරභාරයෙහි තබා ගත යුතු ය ;" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"සිරභාරයෙහි තබා ගත යුතු ය :

එසේ වුව ද, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 103(3) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සහ 1966 අංක 18 දරන පිඩාකාරී ආයුධ පනත යටතේ යම් වරදක් සම්බන්ධයෙන් හැර අසාමාන්‍ය අවස්ථාවල දී එම තැනැත්තා ඇප පිට නිදහස් කිරීම සඳහා අධිකරණයේ හේතු වාර්තාගත කිරීමෙන් පසුව ඒ තැනැත්තා එසේ ඇප පිට නිදහස් කිරීමට, ඒ අධිකරණය මහාධිකරණය නම් ඒ මහාධිකරණයට නිසි බලය තිබිය යුතු ය ; නැතහොත් ඒ අධිකරණය දිසා අධිකරණයක් හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක් නම් ඒ දිසා අධිකරණයේ හෝ මහෙස්ත්‍රාත් අධිකරණයේ දිස්ත්‍රික්කය හෝ කොට්ඨාසය පිහිටා ඇත්තේ යම් කලාපයක් ඇතුළත ද ඒ කලාපයෙහි පවත්වා ගෙන යනු ලබන මහාධිකරණයට ඒ තැනැත්තා එසේ ඇප පිට නිදහස් කිරීමට නිසි බලය තිබිය යුතු ය :

එසේ වුව ද, තව දුරටත් මහාධිකරණයේ ආඥාවකට විරුද්ධව ඒ තැනැත්තා විසින් අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කළ හැකි ය.".

(ආ) එහි (ආ) ඡේදයෙහි "විශේෂ අවස්ථාවල" යන වචන වෙනුවට "අසාමාන්‍ය අවස්ථාවල" යන වචන ආදේශ කරන්න.

(2) එහි (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) මෙහි පළමුවන උපලේඛනයෙහි දැක්වෙන යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම, ඔහු වරදකරු කිරීමට හෝ ඔහුට නියම කරන ලද දණ්ඩන නියමයට හෝ විරුද්ධව අභියාචන

පෙත්සමක් ඉදිරිපත් කර ඇත්තේ වුව ද අභියාචනය තීන්දු කරනු ලබන තුරු ඒ තැනැත්තා සිරභාරයෙහි තබා ගත යුතු ය:

එසේ වුව ද අභියාචනාධිකරණය විසින් අසාමාන්‍ය අවස්ථාවල දී එවැනි තැනැත්තකු ඇප පිට නිදහස් කරනු ලැබිය හැකි ය;".

(3) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඈ) මෙහි දෙවන උපලේඛනයෙහි දැක්වෙන යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකු ම, ඔහු වරදකරු කිරීමට හෝ ඔහුට නියම කරන ලද දණ්ඩන නියමයට හෝ විරුද්ධව අභියාචන පෙත්සමක් ඉදිරිපත් කර ඇත්තේ වුව ද අභියාචනය තීන්දු කරනු ලබන තුරු ඒ තැනැත්තා සිරභාරයෙහි තබා ගත යුතු ය:

එසේ වුව ද, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 103(3) වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අසාමාන්‍ය අවස්ථාවල දී ඒ තැනැත්තා ඇප පිට නිදහස් කිරීම සඳහා අධිකරණයේ හේතු වාර්තාගත කිරීමෙන් පසුව, ඒ තැනැත්තා එසේ ඇප පිට නිදහස් කිරීමට, ඒ අධිකරණය මහාධිකරණය නම් ඒ මහාධිකරණයට නිසි බලය තිබිය යුතු ය; නැත හොත් ඒ අධිකරණය දිසා අධිකරණයක් හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක් නම් ඒ දිසා අධිකරණයේ හෝ මහෙස්ත්‍රාත් අධිකරණයේ දිස්ත්‍රික්කය හෝ කොට්ඨාසය පිහිටා ඇත්තේ යම් කලාපයක් ඇතුළත ද ඒ කලාපයෙහි පවත්වා ගෙන යනු ලබන මහාධිකරණයට ඒ තැනැත්තා එසේ ඇප පිට නිදහස් කිරීමට නිසි බලය තිබිය යුතු ය.".

(4) ඒ වගන්තියේ අතුරු වගන්තිය අත් හැරීමෙන් ; සහ

(5) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "අදාළ නොවිය යුතු බව" යන වචන වෙනුවට "සුළු වෙනස් කිරීම්වලට යටත්ව අදාළ විය යුතු බව." යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙහි (අ) ඡේදය පරිච්ඡින්න කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(අ) බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි මෙහි පළමු වන උපලේඛනයෙහි නැතහොත් දෙවන උපලේඛනයෙහි දැක්වෙන වරදකට යම් තැනැත්තකු වරදකරුවකු කරන

සෑම අධිකරණයක් ම, ඒ අධිකරණයේ දඬුවම් පැමිණවීමේ සාමාන්‍ය බලතල කුමක් වුව ද, බන්ධනාගාරගත කිරීමක් නොවන වෙනත් යම් දඬුවමකට අතිරේකව, ඒ වරද සම්බන්ධයෙන් නියම කර ඇති බන්ධනාගාරගත කිරීමේ උපරිම කාල සීමාවෙන් තුනෙන් එකකට නොඅඩු කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් ඒ තැනැත්තා සම්බන්ධයෙන් කරනු ලැබිය යුතු ය; තවද ".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියෙහි "ශ්‍රේෂ්ඨාධිකරණය" යන වචනය වෙනුවට "අභියාචනාධිකරණය හෝ මහාධිකරණය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"මේ පනත වලංගු කාලය.

8. මේ පනතේ විධිවිධාන 1980 දෙසැම්බර් මස තිස් එක් වන දිනයෙන් අවසන් වන කාලය තුළ ක්‍රියාත්මක විය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයෙහි 8 වන විෂයයෙහි "වරදෙහි ස්වභාවය" යන ශීර්ෂය යටතේ "ඉර බැසීම සහ ඉර නැගීම අතර කාලය තුළ මහා මාර්ගයේ දී" යන වචන වෙනුවට "මහා මාර්ගයේ දී" යන වචන ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) එහි 2 වන විෂයයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් විෂයය ඇතුළත් කිරීමෙන් :—

"2අ—367 වන වගන්තිය : ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට සහ රාජ්‍ය සංස්ථාවලට අයත් චංචල දේපළ සොරකම් කිරීම.".

(2) එහි 5 වන විෂයයෙහි "වරදෙහි ස්වභාවය" යන ශීර්ෂය යටතේ "ඉරබැසීම සහ නැගීම අතර කාලය තුළ මහා මාර්ගයේ දී" යන වචන වෙනුවට "මහා මාර්ගයේ දී" යන වචන ආදේශ කිරීමෙන්.